## නිවැරදිව පෞද්ගලික ලිපි ලියමු.

**පෞද්ගලික ලිපි යනු,**

නෑදෑයින්ට, මිතුරන්ට, පවුලේ සාමාජිකයින්ට, හිතවතුන්ට, ලියන ලිපි පෞද්ගලික ලිපි වශයෙන් හැඳින්වේ.

මෙම ලිපි ලිවීමේදී අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග කිහිපයකි.

- සිංහල ව්‍යාකරණානුකූලව නොව කතා කරන බසින් දිගු විස්තර සහිතව ලිපිය ලියයි.
- ඔබේ අදහස්ථ තොරතුරු, ඉදිරි සැලසුම් ආදිය ඇතුළත් කළ හැකිය.

**<u>පෞද්ගලික ලිපියක කොටස්</u>**

1. යවන්නාගේ ලිපිනය හා දිනය
2. ආශිර්වාදය
    - ජයවේවා!
    - සැරදේවා!
    - සෙත්වේවා!
    - සැපවේවා!
    - නිදුක් වේවා!
    - තෙරුවන් සරණයි!
    - දෙවිපිහිටයි!
    - ජේසු පිහිටයි!
    - දළදා සමිඳු පිහිටයි!
3. ආමන්ත්‍රණය
    - දයාබර අම්මේ / දයාබර තාත්තේ
    - ආදරණීය අම්මේ / ආදරණීය තාත්තේ
    - හිතවත් මිතුර / මිතුර
    - මහත්මයාණෙනි / මහත්මියනි
    - මැතිතුමණි
    - කළමනාකාරතුමනි / තුමියනි
    - ගරු ස්වාමීන් වහන්ස
    - ගරු කන්‍යා සොයුරිය
    - ගරු පියතුමණි

4. අන්තර්ගතය (විස්තරය)
5. අවසානය
    - මෙයට විශ්වාසී
    - මෙයට කීකරු දුව / පුතා / ශිෂ්‍ය
    - මෙයට ආදරණීය දුව / පුතා / ශිෂ්‍ය
    - මෙයට සේවා ලැදි
    - මෙයට විශ්වාසී ඔබේ සදා හිතවත්
    - මෙයට විශ්වාසී ඔබේ මිත්‍ර
6. අත්සන

<u>**පෞද්ගලික ලිපියක ආකෘතිය**</u>

1. යවන්නාගේ නම හා දිනය

2. ආශිර්වාදය

3. ආමන්ත්‍රණය

4. අන්තර්ගතය(විස්තරය)

5. අවසානය

6. අත්සන

---

කමනි මහේෂිකා
අංක 23,
කුමාරතුංග මාවත,
කොළඹ.
2021.05.28

දෙවිපිහිටයි!

ආදරණීය අම්මා වෙත,

අම්මේ, ඔයාගේ සැප සනීප කොහොමද?ගෙදර හැමෝම හොඳින් ඉන්නවා නේද? මමත් හොඳින් ඉන්නවා.මේ දවස්වල වැඩ ගොඩක් වැඩියි.එනිසා මේ සති අන්තෙදි ගෙදර එන්න බැරි වෙයි.ඒවා ඉවර වුණ ගමන් ඉක්මණටම ඔයාලව බලන්න එන්නම්.හැමෝම පරිස්සමින් ඉන්න.හැමෝටම සෙත් වේවා!

මෙයට විශ්වාසී
ආදරණීය දුව
කමනි